ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය
23 JUL 2019
පුස්තකාලය

# දළදා වහන්සේ හා තදනුබද්ධ සංස්කෘතිය පිළිබඳ විමර්ශනයක්

- කල්ලංචියේ රතනසිරි හිමි

ශ්‍රී දළදා වහන්සේ උදෙසා සිදුකෙරෙන පුද සිරිත්වල ආරම්භය ධාතු වන්දනාවේ ඉතිහාසය තරමට ම පැරණි ය. ධාතු වන්දනාව සිදුවූ මුල් කාලයේ දී පැවැති චාරිත්‍ර විධි කාලයත් සමග ක්‍රමානුකූලව සකස්වීමෙන් හා වර්ධනය වීමෙන් දළදා වහන්සේ උදෙසා වර්තමානයේ දී පැවැත්වෙන පුද පූජා හා චාරිත්‍ර විධි සකස් වී යැයි සිතිය හැකිය. බුදුරජාණන් වහන්සේට දැක්විය යුතු ඉමහත් ගෞරවයත් ආගමික අරමුණුත් පෙරදැරි කරගත් එම පුද පූජා හා සිරිත් පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය ශ්‍රද්ධාව ජනනය වන ආකාරයෙන් එම පුද සිරිත් නිර්මාණය වූ බව පෙනේ. ඉන්දීය ආගමික පසුබිම තුළ දළදා වහන්සේ උදෙසා සකස්වූ එම බොහෝ පුද පූජා හා චාරිත්‍ර විධි ඒ අයුරින් ම ලක්දිව දී ද පවත්වා ගත් ආකාරයත් එහි වර්ධනීය සාධකත් ඒ පිළිබඳව දැනට විද්‍යමාන තොරතුරු විමසා බලන විට පැහැදිලිය. මේ ලිපියෙහි අරමුණ වන්නේ එම පුද පූජා හා චාරිත්‍ර විධි තුළින් ඔප් නැංවුණ සංස්කෘතිය පිළිබඳව හඳුන්වා දීමයි.

## කලිඟු රට දළදා වහන්සේ

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ දායකත්වයෙන් හා මහරහතන් වහන්සේලාගේ අනුශාසකත්වයෙන් සර්වඥයන් වහන්සේගේ ශ්‍රී දේහය පිළිබඳ ආදාහන කටයුතු මකුට බන්ධන නම් චෛත්‍ය ස්ථානයේ දී සිදුවිය.[1] තථාගතයන් වහන්සේගේ ශ්‍රී දේහය තැන්පත් කළ එම

23 JUL 2019

චිතකයේ ගිනි දැල් නිවෙන්නටත් පෙර සරභූ හා ඛේම යන මහරහතන් වහන්සේලා දෙනම විසින්

උන්වහන්සේගේ ග්‍රීවා ධාතූන් වහන්සේත් වාම දන්ත ධාතූන් වහන්සේත් සියතට ගනු ලැබූහ. ඒ අනුව සරභූ මහරහතන් වහන්සේ ග්‍රීවා ධාතුව ලක්දිවට වැඩමවා මහියංගණ ස්තූපයේ තැන්පත් කළහ. වාම දළදා වහන්සේ ලබාගත් ඛේම මහරහතන් වහන්සේ එය කලිඟුරට බ්‍රහ්මදත්ත නම් මිථ්‍යාදෘෂ්ටික රජු බුදුදහමට නැඹුරු කරවාගෙන ඔහුට පවරා දුන්හ.[2] අනතුරුව සිදුවූ සර්වඥධාතු බෙදා දීම ද ධාතු වන්දනාව සම්බන්ධයෙන් ශාසන ඉතිහාසයේ ඉතා වැදගත් සංසිද්ධියක් වූ බව නිසැක ය. රටවල් අටක රජදරුවන්ට ලැබුණු එම සර්වඥ ධාතු තැන්පත්කර ඒ ඒ රටවල ස්තූප ඉදිකිරීමත් ඒවාට වන්දනාමාන කිරීමත් නිසා ධාතු වන්දනාව පිළිබඳ අදහස වඩාත් පුළුල්විය. රජවරු බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේ දී උන්වහන්සේට සිදුකළ සියලු ගෞරව හා පුද පූජා උන්වහන්සේගේ පිරිනිවීමෙන් පසුව මේ සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කළ එම ස්තූපවලට සිදුකරමින් උන්වහන්සේට ගෞරව දැක්වූහ. මෙයින් ප්‍රකට වන කාරණය නම්, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පැව ද සර්වඥ ධාතූන් වහන්සේලා ජීවමාන බුදුරජාණන් වහන්සේ ලෙස සලකා ඒ කෙරෙහි ශ්‍රද්ධාව හා ගෞරවය උපදවාගෙන වන්දනාමාන හා පුද පූජා පැවැත්වීමේ ක්‍රමවේදයක් ව්‍යාප්ත වූ බව යි.

ඛේම මහරහතන් වහන්සේ විසින් ලබාදුන් දළදා වහන්සේ ගෞරවයෙන් පිළිගත් කලිඟු රට බ්‍රහ්මදත්ත රජතුමා මහාර්ඝ ධාතු මන්දිරයක් හා ආසනයක් සකස් කරවා එහි එම දළදාව තැන්පත්කර තූර්යවාදන සහිතව ඊට පූජා පැවැත්වීමට කටයුතු කළේය. රජුගේ භාරකාරත්වය හා ආරක්ෂාව යටතේ පැවැති මේ දළදා වහන්සේ වෙනුවෙන් මුල් කාලයේ දී රජු විසින් පවත්වන ලද පුද පූජාවන් සඳහා භික්ෂූන් වහන්සේ මැදිහත්වූ බවක් සඳහන් නොවේ. රජ තමාගේ සිතැඟි පරිදි රාජකීය ආකාරයෙන් ඊට පුද සිරිත් දැක්වීය.[3] බ්‍රහ්මදත්ත රජු



විසින් ඉදිකරවූ දළදා මන්දිරය ඇස දල්වා බැලිය නොහැකි තරම් අලංකෘත වූවක් ලෙසට නිර්මාණය කර තිබූ බව දළදා පූජාවලියෙහි විස්තරකර තිබීමෙන් පැහැදිලි වන්නේ දළදා වහන්සේට තමාගේ උපරිම ගෞරවය ලබාදීමට රජු ක්‍රියාකළ බවයි.[4] විවිධ මුක්තා මාණික්‍ය, වෛඩූර්ය ආදි සැරසිලිවලින් අලංකෘත වූ මේ ධාතු මන්දිරය රාජ මාලිගාවට ද වඩා ශෝභාමත් හා ආකර්ශනීය ආකාරයෙන් නිර්මාණය කරවන ලදි. එහි ම අලංකාර පීඨයක් තනවා එහි දළදා වහන්සේ තැන්පත් කර තිබිණි. මෙසේ දාඨාවංසයේ දැක්වෙන තොරතුරුවලට අනුව කසී කුමරු, සුනන්ද රජු ආදි කලිඟුරට රජ පරපුරේ බොහෝ රජුන්ගේ ආරක්ෂාව යටතේ පුද පූජා කෙරෙමින් ගෞරවයට භාජනය වූ වාම දන්ත ධාතූන් වහන්සේ වසර අටසීයක් පමණ කාලයක් එරට එම මන්දිරයේ ම වඩා හිඳවූ බව සිතිය හැකිය.[5]

### දන්තධාතූන් වහන්සේ කලිඟු නුවරට වැඩමවීම

බ්‍රහ්මදත්ත රාජ පරම්පරාවේ පසුකාලීන රජුන් කීපදෙනෙකු ම ඔවුන්ගේ පරම්පරාවට අයත්ව තිබූ මෙම දළදා වහන්සේ ආරක්ෂා කරගනිමින් ඊට පුදපූජා පවත්වමින් ඉමහත් ගෞරවයක් දක්වූ බව සඳහන්වේ. ඒ අනුව බඹදත් රජු ඇවෑමෙන් දළදා වහන්සේගේ භාරකාරත්වය හිමිවූ ඔහුගේ පුත්‍ර කාසිරාජ නමැති රජතුමා මැණික් පහන්වලින් ධාතු මන්දිරය ආලෝකවත් කළේය. අනතුරුව ඔහු පුත් සුනන්ද කුමාරයාත් ඉක්බිති ඔහුගේ පුත්‍ර ගුහසීවටත් දළදා වහන්සේගේ භාරකාරත්වය හිමිවිය. ගුහසීව රජ නිගණ්ඨ අදහස් අනුව ක්‍රියාකළ අයෙක් බැවින් දළදා වහන්සේට නිසි පුදපූජා නොකළා පමණක් නොව ඊට විවිධ වධහිංසා හා පීඩාවන් ද සිදු කළේය. එහෙත් පසුව ඇමතියන්ගේ කරුණු පෙන්වා දීමට අනුව ඔහු දළදා වහන්සේ කෙරෙහි පැහැදී තමන් නොමග යැවූ නිවටුන් සිය රටින් පිටිවහල් කළේය. එයින් කෝපයට පත් නිගණ්ඨයෝ පැළලුප් නගරයේ පඬි රජු වෙත ගොස් ගුහසීව රජු බ්‍රහ්ම හා ශිව වැනි දෙවියන් නොපුදා මිනී ඇටයක් පුදන බවට චෝදනාකර ඊට නිසි දඬුවම් කරන මෙන් දැන්වූහ. සිය සාමන්ත රජුගේ මේ ක්‍රියාව පිළිබඳ කිපුණු පඬි රජ

ඔහු යටත්කර මිනී ඇටය ද රැගෙන එන ලෙස තවත් සාමන්ත රජෙකු වූ චිත්‍රයාන රජු කාලිඞ්ගයට පිටත් කළේය. මෙහි දී උපක්‍රමශීලීව ක්‍රියාකළ ගුහසීව රජතුමා සටන් කරනු වෙනුවට චිත්‍රයාන රජු සුහදව පිළිගෙන ඔහු ධාතු මන්දිරයට කැඳවාගෙන ගොස් දන්තධාතුන් වහන්සේ ද පෙන්වා අනතුරුව ඔහු තුළ ඒ කෙරෙහි විශ්වාසය ගොඩනැංවීම සඳහා දළදා වහන්සේට ප්‍රාතිහාර්ය දක්වන මෙන් ආරාධනා කළේය. එවිට දන්ත ධාතුන් වහන්සේ අහසට පැනනැගී බුදුරැස් විහිදූහ.[6] චිත්‍රයාන රජු ඒ ප්‍රාතිහාර්යයෙන් ප්‍රසාදයට පැමිණ බුදුන් සරණ ගිය අතර ඉන්පසු එම රජුන් දෙදෙනා අතර සුහදතාව ද වර්ධනය විය. එහෙත් පඬි රජුගේ අණ ඉක්මවිය නොහැකි බැවින් දන්ත ධාතුන් වහන්සේත් රැගෙන පැළලුප් නුවරට ගොස් ඔහු හමුවන ලෙස ගුහසීව රජුට චිත්‍රයාන රජු විසින් දන්වනු ලැබිණි. ඒ අනුව දළදා වහන්සේ හිස මතින් වඩමවාගෙන ඔහු බැහැදැකීමට පැළලුප් නුවරට පැමිණෙන ගුහසීව රජු කෙරෙහි තම කෝපය නිගණ්ඨයන්ගේ කේලාම් බසින් තවදුරටත් අවුලුවාගත් පඬි රජතුමා ධාතුන් වහන්සේට විවිධ වදහිංසා පැමිණවීමට නියෝග කරමින් එය විනාශ කිරීමට කීප විටක් උත්සාහ කළේය.

## දන්තධාතුන් වහන්සේ පෑ ප්‍රාතිහාර්ය

පඬි රජු දළදා වහන්සේ ගිනි අඟුරු වළකට දමා පිළිස්සීමට කළ උත්සාහය ගින්න මැදින් පැන නැඟුණු පියුමක් විසින් වැළකීම ප්‍රථම ප්‍රාතිහාර්යයි. එම පියුමෙහි පිහිටි ධාතුන් වහන්සේ සුදු බුදුරැස් විහිදුවා රැස්ව සිටි ජනතාව සතුටට පත්කළහ.[7] අනතුරුව ඒ රජුගේ ම අණින් දළදාව කිණිහිරක තබා තැලීමට නියම වූයේය. එහි දී පළමු මිටි පහරින් ම දළදාව අඩක් කිණිහිර තුළට ගිලා බැස්සේය. පසුව කිසිවකු විසිනුත් එය කිණිහිරෙන් උගුලුවාගත නොහැකිව තිබෙන විට සුභද්‍ද නමැති සිටුපුත්‍රයෙක් එය ගැනීමට ඉදිරිපත්වී බුදුගුණ වර්ණනා කළේය. එයින් දන්ත ධාතුන් වහන්සේ කිණිහිරෙන් අහසට පැනනැගී රශ්මිය විහිදුවමින් රැස්ව සිටි ජනතාව සතුටට පත්කළහ. එහෙත් එය සිටු පුත්‍රයාගේ විජ්ජා බලයක් නිසා සිදුවූවක් වියහැකි යැයි නිවටුන් කී බැවින් එයින් ද පඬි රජ සෑහීමකට පත්නොවීය. මේ



නිසා සුභද්‍ද සිටු පුත්‍රයා වෙනත් ප්‍රාතිහාර්යයක් දක්වන මෙන් දළදා වහන්සේගෙන් අයැද සිටියේය. ඒ අනුව දන්තධාතුන් වහන්සේ හංසයකු මෙන් දියෙහි ගිලෙමින් උඩට මතුවෙමින් දක්ෂිණා වෘත්තව දිය මතු පිට ගමන් කළහ. එයින් ද තෘප්තිමත් නොවූ පඬිරජ නැවත දළදා වහන්සේ නගරයේ වීථිය මැද වළක දමා පස් පුරවා ඇතුන් යොදා පෑගීමට කටයුතු කළේය. ඒ අවස්ථාවේ දී එම වළෙන් පැන නැඟුණු පියුමක් මත ධාතුන් වහන්සේ වැඩ සිටියහ. මේ ආශ්චර්ය දුටු මහජනයා සාධුනාද පවත්වමින් වස්ත්‍රාභරණවලින් ධාතුන් වහන්සේට පූජා පැවැත්වූහ. මෙයින් ද සතුටට පත් නොවූ නිගණ්ඨයෝ මළ-මූත්‍රවලින් පිරුණු අසූචි වළකට දළදා වහන්සේ දැමීමට කටයුතු කළහ. එවිට ඒ අසූචි වළ පස් පියුමෙන් සුසැදි නන්දා පොකුණ මෙන් විය. රජු එපමණකින් පවා සෑහීමට පත් නොවූවත් එතෙක් වේලා නිහඬව සිටි අමාත්‍යයෝ රජු වෙත පැමිණ මෙතරම් සෘද්ධි ප්‍රාතිහාර්ය දක්වමින් තිබෙන දන්තධාතුන් වහන්සේගේ ආශ්චර්ය වටහා ගැනීමට ප්‍රඥාව නොමැති දැයි රජුගෙන් ප්‍රශ්න කළහ. අනතුරුව තමාගේ මිථ්‍යාදෘෂ්ටික අදහස් නිසා දළදා වහන්සේට සිදුකළ අපරාධ ගැන ශෝකයට පැමිණි පඬි රජතුමා තෙරුවන් සරණ ගියේය. පසුව දන්තධාතුන් වහන්සේ රැගෙන එන ලෙස සේනාධිනායක අමාත්‍යවරයාට දැන්වීය. එම අමාත්‍යවරයා දිය අගල සමීපයට ගොස් පියුම් මත වැඩසිටි දළදා වහන්සේගෙන් රජුගේ වැඩිදුර පැහැදීම සඳහා ප්‍රාතිහාර්යයක් දක්වන මෙන් අයැද සිටියේය. එවිට දන්තධාතුන් වහන්සේ පියුමෙන් පියුමට වඩිමින් නගරය ම සුදු බුදුරැසින් ආලෝකමත් කළහ.[8]

පඬි රජතුමා තමන් කළ වරදට සමාව අයදිමින් දළදා වහන්සේට වන්දනා කරන විට උන්වහන්සේ ඔහුගේ ඔටුන්නෙහි පිහිටා බබලන්නට වූහ. අනතුරුව රජතුමා ඒ දළදා වහන්සේ නගරයට වැඩමවා විවිධ පූජා පවත්වා එයින් ද නොනැවතී ධනධාන්‍ය සහිත රට ම පුදා ගෞරව දැක්වූයේය.[9] අනතුරුව ඔහු සමඟ යුද්ධයට පැමිණි ඛීරධාර නම් රජු ජීවිතක්ෂයට පත්කළ පඬිරජතුමා දළදා වහන්සේ ගුහසීව රජුට ම භාර දී

නැවත කාලිඞ්ගයට එය රැගෙන යාමට ඉඩදී රාජ්‍ය තම පුතුට පැවරුවේය.

දළදා වහන්සේ කාලිඞ්ගයට නැවත වැඩමවීමෙන් පසු උදේනි රජුගේ පුත් දන්ත කුමරු එය වන්දනා කිරීමට දන්තපුරයට පැමිණ ගුහසීව රජුගේ දියණිය වූ හේමමාලා සමඟ මිත්‍රත්වයක් ගොඩනඟා ගනියි. අනතුරුව ගුහසීව රජු ඔවුන්ගේ විවාහය සිදුකර දන්ත කුමරුට දළදා ආරක්ෂක තනතුර පිරිනැමුවේය. දන්තධාතූන් වහන්සේගේ ආරක්ෂාව උදෙසා නිලවශයෙන් පත්කළ ප්‍රථම තනතුර ලෙස එය හැඳින්විය හැකිය. මේ අතර පඬි රජු සමඟ කළ යුද්ධයෙන් ජීවිතක්ෂයට පත්වූ ඛීරධාර රජුගේ බෑණා ගුහසීව රජු සමඟ දළදා වහන්සේ ඉල්ලා යුද්ධයට ආවේය. යම්හෙයකින් යුද්ධයෙන් පරාජයවී දළදා වහන්සේ සතුරා අතට පත්වනු දැකීමට අකමැතිවූ ගුහසීව රජතුමා දන්තකුමරු හා හේමමාලා අමතා එහි ආරක්ෂාව පිණිස සීහළේ (ලංකාවේ) රාජ්‍යත්වයට පත්වී සිටින ස්වකීය මිත්‍ර මහසෙන් රජු වෙත දන්තධාතූන් වහන්සේ රහසින් රැගෙන යන ලෙස දන්වා යුද්ධයට පිටත්විය.[10] ඛීරධාර රජුගේ බෑණා සමඟ කළ මහා සටනින් සිය මයිලනුවන් වූ ගුහසීව රජු ජීවිතක්ෂයට පත්වූ බව ඇසූ දන්තකුමරු වහවහා දළදා වහන්සේත් හේමමාලාවනුත් සමඟ දකුණු දේශයට පළා ගොස් තාම්‍රලිප්තියෙන් සීහළදීපයට පැමිණීමට නැව් නැඟුණේය.

## දළදා වහන්සේ ලංකාවට වැඩමවීම හා පුදපූජා

දන්ත ධාතූන් වහන්සේ තම රජ පරපුරට උරුම වූ අවස්ථාවේ සිට ඊට දැක්විය යුතු රාජ්‍ය ගෞරව හා පුද සිරිත් මහත් ඕනෑකමින් සිදුකළ කලිගු රජ පෙළපතේ ගුහසීව රජු සතුරු ආක්‍රමණ නිසා උන්වහන්සේට සිදුවන්නට යන මහා අනතුර පිළිබඳ වඩාත් කණස්සල්ලට පත්වූ බව පෙනේ. පඬි රජුගෙන් දළදා වහන්සේට සිදුවූ අපමණ ගැහැට අත්දුටු රජු එබඳු තීරණයක් ගැනීමට පසුබට නොවන්නේ, දළදා වහන්සේ කෙරෙහි ඔහු තුළ පැවැති ශ්‍රද්ධාව හා ගෞරවය නිසාම බව



සිතිය හැකිය. දළදා වහන්සේ සතුරු රජුට හසුවීමෙන් සිදුවිය හැකි ඊළඟ විපත පිළිබඳ සැලකූ හෙතෙම එය ලක් රජුට ලබාදීමට තීරණය කරන්නේ සම්බුද්ධ සසුනත් භික්ෂූන් වහන්සේත් ලංකාද්වීපයෙහි ස්ථිරව පවත්නා නිසා පමණක් නොව තමාගේ ඉෂ්ටමිත්‍ර මහසෙන් රජු දන්ත ධාතූන් වහන්සේට පූජා පැවැත්වීමට මීට පෙර ඉල්ලීමක් ද කර තිබීම නිසා බව දළදා පූජාවලියේ සඳහන් වේ.[11] මෙයින් පැහැදිලි වන්නේ දළදා වහන්සේගේ ආරක්ෂාව මෙන් ම පුද සිරිත් පැවැත්වීම සම්බන්ධයෙන් මහත් ඕනෑකමක් ගුහසීව රජු තුළ තිබූ බව යි. ගුහසීව රජුගේ මේ තීරණය සිය පරපුරේ උරුමය රැක ගැනීමට ප්‍රයත්න දැරීමකට වඩා දළදා වහන්සේ කෙරෙහි පැවැති ඔහුගේ අසීමිත ශ්‍රද්ධාවත් ගෞරවයත් එලෙස ම පවත්වා ගැනීමට ගත් පියවරක් ලෙස සැලකිය හැකිය. දළදා පූජාවලියේ සඳහන් කෙරෙන රජු හා දන්ත කුමරු අතර සිදුවන සංවාදයෙන් ඒ බව සනාථ වේ. තමන් ලක්දිවට දන්ත ධාතූන් වහන්සේ වැඩමවීමෙන් එහි ආරක්ෂාව පමණක් නොව පුද පූජා ද නිසි පරිදි සිදුවීම නිසැක බව රජ සිය බෑණනුවන්ට විස්තර කළේය.[12] කෙසේ වෙතත් දන්ත ධාතූන් වහන්සේ ලක්දිවට වැඩමවන අවස්ථාව වන විට මහසෙන් රජු අභාවප්‍රාප්තවී ඔහු පුත් කීර්ති ශ්‍රී මේඝවර්ණ කුමරු රාජ්‍යයට පැමිණ සිටියේය. මේ ප්‍රවෘත්තිය මහාවංසයේ දැක්වෙන්නේ එළු දළදාවංසයේ සඳහන් පරිදි බව ද කියැවේ.[13] දාඨාවංසය, එළු දළදාවංසය හා දළදා සිරිත ඇතුලු ඓතිහාසික ලේඛනවල දක්වෙන පරිදි ගුහසීව රජු විසින් දන්තකුමරුට හා හේමමාලාවට ස්වකීය මිත්‍ර ලක්දිව මහසෙන් රජු වෙත දළදා වහන්සේ ආරක්ෂාව පිණිස රැගෙන යන ලෙස දන්වා ඇත.[14] ඒ අනුව ඔවුන් දෙදෙන ලක්දිව පැමිණෙන අවස්ථාවේ මහසෙන් රජු අභාවප්‍රාප්තවී සිටි අතර මෙහි රාජ්‍යය විචාරනු ලැබුවේ ඔහුගේ පුත් කිත්සිරිමෙවන් රජු බව මහාවංසයේ සඳහන් වෙයි. එයින් අනුමාන කළහැකි එක් කාරණයක් නම් කාලිඞ්ගයේ සිට දක්ෂිණ දේශය හරහා ලක්දිවට දළදා වහන්සේ වැඩමවීම සඳහා සෑහෙන කාලයක් ගතවන්නට ඇති බවයි. කෙසේ වෙතත් දළදා වහන්සේ රැගත්

මේ ආගන්තුකයෝ දෙදෙන ලක්දිව පැමිණ මෙහි පුවත් දන ප්‍රථමයෙන් ම රජු හමු නොවී රජු හා සබඳතා ඇතිව වාසය කළ මේඝගිරි විහාරයේ භික්ෂුවක් හමුවී තමන් පැමිණි කාරණය උන්වහන්සේට දන්වූහ. දළදා වහන්සේ පිළිබඳ පුවත ඇසීමෙන් මහත් සොම්නසට පැමිණි එම භික්ෂුව සිය කුටිය වටතිර ඇද සරසා දළදා වහන්සේ එහි යහනක තැන්පත්කර පූජා පවත්වා මෙපවත් දන්වනු පිණිස කිත්සිරිමෙවන් රජු වෙත වෙනත් භික්ෂුවක් පිටත්කළේය.[15]

කිත්සිරිමෙවන් රජු හමුවූ එම භික්ෂුව දළදා වහන්සේ වැඩමවීම පිළිබඳ මේ ප්‍රවෘත්තිය රජුට දන්වූ අතර එයින් ඉමහත් සොම්නසට පැමිණි ඔහු තමන් සක්විති රාජ්‍යය ලැබූවකු සේ සිතුවේය. අනුරාධපුර නගරයට ඊශාන දිගින් පිහිටා තිබූ මහමෙවුනා (මේඝ) ගිරි විහාරයට පාගමනින් ම ගිය රජතුමා දළදා වහන්සේ වැඳපුදාගෙන ලක්දිව රාජ්‍යයෙන් ධාතූන් වහන්සේට පූජා පැවැත්වීය.[16] එහිදී රජතුමා දළදා වහන්සේගේ පැහැය මලින වර්ණ බැවින් එය සුදෝසුදු වියයුතු යැයි ඒ පිළිබඳ කිසියම් සැකයක් ඇතිකර ගත්තේය. ඒ අවස්ථාවේ දී දළදා වහන්සේ අහසට පැන නැගී දක්ෂිණාවර්තව ගමන් කරමින් සවනක් බුදුරැස් විහිදුවමින් රැස්ව සිටි සැමදෙනා සතුටු කළහ. එවිට රජතුමා දන්තධාතූන් වහන්සේ අසුනක වඩා හිඳුවා දෑසමත් මල් වර්ෂාවකින් ධාතූන් වහන්සේ වැසෙන තරම් පූජා කළේය. ධාතූන් වහන්සේ ක්ෂණයකින් මල් මතුපිටට වඩිමින් සුදු බුදුරැසින් බබලන්නට වූහ. අනතුරුව දුහුල් පටපිළියෙන් දළදා වහන්සේ වසනු ලැබීය. එවිට ද ධාතූන් වහන්සේ ඒ දුහුල් වස්ත්‍ර පළාගෙන මතු පිටට පැමිණ සිටියහ. මෙසේ විවිධ පෙළහර දක්වීමෙන් අනතුරුව දළදා වහන්සේ කරඬුවක තබා රජමාළිගයට වැඩමවා එහි තැන්පත්කර පසුව ඒ වෙනුවෙන් ම මන්දිරයක් තනවා ඊට වැඩමවූහ. එය දළදා වහන්සේ උදෙසා නිර්මාණය කළ ප්‍රථම දළදා මන්දිරයයි. අනුරාධපුර පැරැණි නගරයේ නටබුන් අතර අදත් මේ ආගමික ගොඩනැගිල්ලෙහි අවශේෂ දක්නට ලැබේ.



කීර්ති ශ්‍රී මේඝවර්ණාභය රජු සුවිශේෂ මන්දිරයක් තනා දන්තධාතූන් වහන්සේ එහි තැන්පත් කිරීම පමණක් නොව එය ජනතාවට ප්‍රදර්ශනය කිරීම සඳහා ඒ වෙනුවෙන් පෙරහැර පැවැත්වීම ද ආරම්භ කළ බව සඳහන්වේ. එකල තුන් නිකායක් වූ බවත් එම නිකාය තුනේ ම භික්ෂූන් වහන්සේලාගේ අදහස්වලට රජු අවනතවීම චාරිත්‍රයක්ව පැවැති බවත් ඇතැම් ඓතිහාසික තොරතුරුවලින් අනාවරණය වී තිබේ. කෙසේ වෙතත් දළදා පෙරහැර පැවැත්වීම සම්බන්ධයෙන් නිකාය තුනේ ම අදහස්වලට සවන්දුන් රජතුමා පෙරහැර දළදා මන්දිරයේ සිට උත්තරාරාමයට (අභයගිරි විහාරයට) ගමන් කරවීමටත් එහි දළදා වහන්සේ ප්‍රදර්ශනයකර නව ලක්ෂයක වියදමින් පූජා පැවැත්වීමටත් තීරණය කළේය.[17] ඒ අනුව සුදු අසුන් යෙදූ රථයක නංවාගත් දළදා වහන්සේ අභයුත්තර විහාරයට වැඩමවා එහි දී පුදසිරිත් පැවැත්වීය.[18] ඔහුගේ සොයුරු ජෙට්ඨතිස්ස රජු දළදා කරඬුවට සඳුන් කිරිපැන් ඉස අටළොස් වර්ගයක පූප ජාති පූජා කළ බව කියැවේ.[19] එම දළදා පෙරහැර පසුකාලීන රජුන් විසින් ද අනුගමනය කරන ලදුව ක්‍රමයෙන් දියුණු වෙමින් අවුත් වර්තමාන තත්ත්වයෙන් ඇසළ පෙරහැර ක්‍රියාත්මක වන බව බෙහෙවින් සිතන්නට ඉඩ තිබේ.

දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩමවීමෙන් පසු එය රජුන් අතර ඉතා ජනප්‍රියත්වයට පත්වූ රාජ්‍ය සංකේතය බවට පත්විය.[20] එතෙක් පාත්‍රා ධාතුවට පමණක් හිමිවී තිබුණු රාජ්‍යත්වය පිළිබඳ උරුමය ඉන්පසු දළදා හා පාදා දෙකට ම ලැබිණි. ඒ අනුව ලක්දිව රාජ්‍ය පාලකයෝ දළදා-පාදා දිවිහිමියෙන් ආරක්ෂා කිරීමට බැඳී සිටියහ.[21] ඔවුහු එම මහාර්ඝ ධාතූන් වහන්සේලා ස්වකීය භාරයෙහි තබාගත් අතර ශාසනභාරධාරී භික්ෂූන් වහන්සේලා සමඟ සාකච්ඡාකර ඒ සඳහා කළයුතු පුදපූජා හා වතාවත් ක්‍රමානුකූලව ඉටුකළ බව දළදා සිරිත හා දළදා පූජාවලිය වැනි ඒ සම්බන්ධයෙන් ම රචනාවූ කෘතිවල දක්වෙන තොරතුරුවලින් අනාවරණය වෙයි. එම ධාතූන් වහන්සේලා රජු භාරයේ පැවතුණත් එහි ආරක්ෂාව සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලා ද වගකීමෙන් යුතුව ක්‍රියාකළ

බව ප්‍රකට කාරණයකි.[22] සතුරු ආක්‍රමණ හමුවේ ආරක්ෂාව පිණිස රාජධානි නිරත දිගට සංක්‍රමණය වන විට දළදා වහන්සේ ද ඒ ඒ ස්ථානවලට වැඩමවා උන්වහන්සේ තැන්පත් කිරීම සඳහා දළදා මන්දිර ඉදිකළ බව සඳහන්වේ. මහා පරාක්‍රමබාහු රජතුමා දළදා මන්දිරයක් ඉදිකර දළදා-පාදා එහි තැන්පත්කර පූජා පැවැත්වූ අතර මැණික්, රන් හා රිදීයෙන් කරඬු තුනක් සාදවා දන්ත ධාතූන් වහන්සේ ඒවායේ තැන්පත් කළේය.[23] නිශ්ශංකමල්ල රජතුමා පොළොන්නරුවේ දළදා මන්දිරයක් හැට පැයකින් සාදා නිමකළේය.[24] දඹදෙණි යුගයේ දී තෙවැනි විජයබාහු රජතුමා දළදා මන්දිරයක් බෙලිගල ඉදිකර දන්තධාතූන් වහන්සේ හා පාත්‍රා ධාතුව එහි තැන්පත් කරවීය.[25] දෙවැනි පරාක්‍රමබාහු රජ දඹදෙණියේ සිය මාළිගාව සමීපයේ දළදා මන්දිරයක් ඉදිකර ඒ ධාතූන් වහන්සේලා එහි වැඩමවා දවස්පතා පුදපූජා පැවැත්වීමටත් ආරක්ෂාව සැලසීමටත් නියෝග කළේය.[26] දඹදෙණි භුවනෙකබාහු රජ දවසක් දවසක් පාසා මහා පූජාවක් දළදා වහන්සේ උදෙසා පැවැත්වූ බව සඳහන්වේ.[27] ඔහුගේ රාජ්‍යෝදයෙන් පසු ලක්දිව ආක්‍රමණය කරන ආර්යචක්‍රවර්ති නම් ද්‍රවිඩ සේනාධිපතියා දළදා වහන්සේ පැහැරගෙන පඬි රටට රැගෙන ගොස් එහි කුලශේඛර නම් රජුට ලබාදුන්නේය.[28] එයින් මහත් කම්පාවට පත් රටවැසියාගේ සන්තාපය වළකන ලද්දේ සිව්වැනි පරාක්‍රමබාහු රජු විසිනි. බෝසත් විජයබාහු රජුගේ පුත්‍රයා වූ ඔහු පඬි රටට ගොස් සාමයෙන් සාකච්ඡා කර දළදා වහන්සේ නැවත ලබාගෙන ලක්දිව වැඩමවා දිනපතා පූජා පැවැත්වූ බව සඳහන්වේ.[29] ඔහු තුන් මහල් දළදා මන්දිරයක් හස්තිසේලපුර සිය මාළිගය අසල ඉතාමත් අලංකාර ලෙස ඉදිකර දළදා-පාදා එහි තැන්පත් කළේය.[30] කුරුණෑගල රාජ්‍ය සමයේ පණ්ඩිත පරාක්‍රමබාහු රජු විසින් ධාතු පූජා වශයෙන් කෙත්වතු දැසි දස් ආදීන් පමණක් නොව ඇත් අස් ගව මහීෂාදි සතුන් ද දළදා වහන්සේට පූජා කළ බව සඳහන්වේ.[31] පස්වැනි භුවනෙකබාහු රජතුමා ද රිදී සත්දහසක් වටිනා කරඬුවක් තනවා දළදා වහන්සේට පූජා කළේය.[32] අනතුරුව වීරබාහු රජ



තුන්මහල් දළදා මන්දිරයක් අලංකාර ලෙස තනවා රනින් නිමකළ ධාතු කරඬු හතරක් තුළ දළදා වහන්සේ තැන්පත් කළේය. මෙසේ දඹදෙණියෙන් පසු කුරුණෑගලටත් එතැනින් ගම්පළ හා කෝට්ටේ රාජධානිවලටත් වැඩමවූ දන්තධාතූන් වහන්සේ මහනුවරට වැඩමවන ලද්දේ විමලධර්මසූරිය රාජ්‍ය සමයේ දීය. කෝට්ටේ රාජ්‍ය සමයේ එල්ලවූ සතුරු විපත් නිසා හිරිපිටියේ රාළ වැනි පුද්ගලයන්ට පවා දළදා වහන්සේගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරන්නට සිදුවූ බව පෙනේ.[33]

දන්තධාතූන් වහන්සේගෙන් ආශිර්වාද ලබාගැනීම මෙන් ම උන්වහන්සේ ඉදිරියේ ස්වකීය ආධ්‍යාශය මස්තකප්‍රාප්ත කරගැනීම උදෙසා සපථ කිරීම ද රජුන් ඇතුළු බොහෝ දෙනා විසින් සිදුකළ බව පෙනේ. දෙවැනි පරාක්‍රමබාහු රජතුමා දළදා වහන්සේ ස්වකීය අත්ලෙහි තබාගෙන සතුරන් පරදවා ලෝකශාසනික අභිවෘද්ධියට ක්‍රියාකරන බවට පොරොන්දු වූ අතර ඊට ප්‍රතිචාර වශයෙන් ප්‍රාතිහාර්යයක් දක්වන ලෙසටත් අධිෂ්ඨාන කළේය. ඔහුගේ එම ප්‍රාර්ථනාව සමෘද්ධ වන බවට සාක්ෂ්‍යය වශයෙන් දන්ත ධාතූන් වහන්සේ අත්ලෙන් අහසට පැනනැගී බුදුරුවක් මවා ෂඩ්වර්ණ බුද්ධ රශ්මියෙන් දිශා ආලෝකමත් කර නැවත අත්ලෙහි පිහිටි බවත් සඳහන්වේ.[34]

ශ්‍රී විජය රාජසිංහ රජතුමා දළදා වහන්සේ තැන්පත්කර ඇති ධාතු කරඬුවල යතුරු හැර එය විවෘතකර දන්තධාතූන් වහන්සේ මණ්ඩපයක සියතින් ම වඩා හිඳුවා මහජනතාවට ප්‍රදර්ශනය කළ බව දළදා පූජාවලියෙහි දක්වේ.[35] ඒ රජතුමා දන්තධාතූන් වහන්සේ තැන්පත් කිරීම සඳහා නිල් මැණික් හා මුතු එබ්බවූ රියන් එකහමාරක ප්‍රමාණයෙන් යුක්ත ධාතු කරඬුවක් කරවමින් සිටිය දී අභාවප්‍රාප්ත වූ බව ද සඳහන්වේ.[36]

මෙසේ ආරම්භ වූ දළදා පුද සිරිත් හා දළදා පෙරහැර අඛණ්ඩව සිදුකිරීමට ලංකා රාජ්‍ය ඉතිහාසය තුළ සෑම රජ කෙනෙකු ම මහත් වුවමනාවෙන් යුතුව වග බලාගෙන ඇත. දළදා පුද සිරිත් ඉටුකිරීම පිළිබඳ ඔවුන්ගේ මෙම ශ්‍රද්ධාවේ හා

ගෞරවයේ පරම ප්‍රතිඵලය වශයෙන් පසු කාලයේ දී දළදා වහන්සේ හෙළරජ කිරුළෙහි උරුමය බවට පත්වූහ. එපමණකුදු නොව කාලයෙන් කාලයට ඒ ඒ රජුගේ බාරයට පත්වන දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා රාජමාළිගාවේ ම සුවිශේෂ කුටියක් හෝ ඒ ආසන්නයේ වෙනම ම ඉදිකළ මන්දිරයක් භාවිතයට ගත් බව ඒ පිළිබඳ ඓතිහාසික සාධකවලින් සනාථ වේ. ජීවමාන බුදුරජාණන් වහන්සේට දැක්වූ ගෞරවය ම එහි අඩුවක් නොමැතිව දන්ත ධාතුන් වහන්සේ උදෙසා ද ලබාදීම එහි එක් අරමුණක් විය. රජු තමන් වාස භවනය කරගත් මාලිගාවට වඩා උසස් අයුරින් දන්තධාතු මන්දිරය නිර්මාණය කළේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි දැක්විය යුතු සිය ගෞරවය හා ශ්‍රද්ධාව උපරිමයෙන් ඉස්මතුකර පෙන්වීම සඳහා ය. රාජමාලිගා පරිශ්‍රයෙහි දළදා මන්දිරය නිර්මාණය කිරීමේ සම්ප්‍රදාය ආරම්භ වීමේ තවත් හේතුවක් නම් දන්ත ධාතුන් වහන්සේගේ ආරක්ෂාව තහවුරු කිරීමයි. කෙසේ වෙතත් ලක්දිවට දන්ත ධාතුන් වහන්සේ වැඩම කිරීමෙන් පසුව භික්ෂූන් වහන්සේ ඊට වතාවත් හා පුද පූජා පැවැත්වීමට යොමු විය. ඒ අනුව දළදා වහන්සේ හා සබැඳි සංස්කෘතියක් සකස් වූ බව ද සඳහන් කළ හැකිය.

මෙසේ සලකන විට දළදා වහන්සේ සමඟ සබැඳුණු වත් සිරිත් හා පුද පූජා ධාතු වන්දනාව සංකේතවත් කරනු පමණක් නොව ලාංකේය සංස්කෘතිය පෝෂණය කිරීමට ද විශාල බලපෑමක් සිදුකර ඇති බව පෙනේ.

## ආන්තික සටහන්

1. මහාපරිනිබ්බාන සුත්ත. දීඝනිකාය 2. (2004 පුනර් මුද්‍රණය). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල. 252 පිටුව.
2. -එම- 264 පිටුව; දාඨාවංසො, වනරත්න, රංජිත් (සංස්.). (2000). සමයවර්ධන පොත්හල. කොළඹ-10. 2:119. 86 පිටුව.
3. දාඨාවංසො, වනරත්න, රංජිත් (සංස්.). (2000). සමයවර්ධන පොත්හල. කොළඹ-10. 2:123-126. 88-89 පිටු.
4. දළදා පූජාවලිය. (1957). මේධානන්ද හිමි, වටද්දර (සංස්.). ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම. කොළඹ. 18-19 පිටු.



5. දාඨාවංසො, (2000). 2:126. 89 පිටුව.
6. දාඨාවංසො. 2:123.
7. දාඨාවංසො. 2:123.
8. දාඨාවංසො. 3:84.
9. දාඨාවංසො. 3:95.
10. දාඨාවංසො. 4:16-18.
11. දළදා පූජාවලිය. (1957). 40 පිටුව.
12. - එම- 40-41 පිටු.
13. සිංහල මහාවංශය, 37:91-93, 167 පිටුව.
14. දළදා පූජාවලිය. (1957). 47 පිටුව.
15. දළදා සිරිත. (1970). 35 පිටුව. (වැලිවිටියේ සෝරත නාහිමියෝ දක්ෂිණ මේඝගිරි විහාරය නමින් වෙනත් තැනක හැඳින්වෙන්නේ මහමෙවුනා උයන මධ්‍යයේ පිහිටි දළදා සිරිත දක්වන මෙම මේඝගිරි විහාරය යැයි පවසති. -එම- 88 පිටුව)
16. දාඨාවංසො, (2000). 5:360, 210 පිටුව; දළදා පූජාවලිය. 49 පිටුව.
17. සිංහල මහාවංශය, 37:94-95, 167 පිටුව.
18. -එම- 167 පිටුව.
19. දළදා පූජාවලිය. (1957). 47 පිටුව.
20. සිංහල සමාජය හා සංස්කෘතිය. 99 පිටුව.
21. පූජාවලිය. 787 පිටුව.
22. –එම- 785 පිටුව.
23. මහාවංසො. 82.11-14.
24. පූජාවලිය. 784 පිටුව.
25. -එම-. 785 පිටුව.
26. මහාවංසො. 82.7-9.
27. -එම- 90.42.
28. -එම- 90.47.
29. -එම- 90.50-59.
30. -එම- 90.66-73.
31. -එම- 90.76.
32. -එම- 91.12.
33. ඉලංගසිංහ, මංගල. මධ්‍යකාලීන ලංකාවේ ආගම. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ - 2005. 261 පිටුව.
34. මහාවංසො. 82.41.
35. දළදා පූජාවලිය. (සංස්.) ඉන්දරතන හිමි, මිනුවන්ගමුවේ. ශ්‍රී ලංකා ප්‍රකාශක
සමාගම. කොළඹ. 1957. 84 පිටුව.
36. දළදා පූජාවලිය. 85 පිටුව.

ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය
23 JUL 2019
පුස්තකාලය